
# පින්කි



තසලි හඳපාන්ගොඩ

# පින්කි

තසලි හඳපාන්ගොඩ

# පින්කි

එච්.එම්. තසලි හඳපාන්ගොඩ

කතෘ

පළමු දිග හැරීම

කු/ ශාන්ත බර්නදෙත් ආදර්ශ මහා විද්‍යාලය,

(ජාතික පාසල) - පොල්ගහවෙල.

3 ශ්‍රේණිය E

පළමු මුද්‍රණය - 2025.02.08

ISBN - 978-624-208-315-5

# පිදුම

මා මෙලොවට බිහිකළ
මගේ ආදර අම්මා
කුසලානි තිලකරත්න...
මා පෝෂණය කළ
මගේ ආදර අප්පච්චි
සලිත හඳපාන්ගොඩ...
මගේ තනියට ඉන්න
ආදර මල්ලිලා දෙදෙනා
සෙත් මල්ලී සහ
ලිසත් මල්ලීට
ආදරෙන් පුදමි...

# ස්තූතිය...

පොතක් ලියන්නට මග පාදා දුන්

මහාමායා විදු මෑණියන්ටත්...

මහාමායා විදුහල්පතිතුමියටත්...

"පොත් සර්" සෙනෙවිරත්න ගුරු පියාණන්ටත්...

තනූජා රත්නායක නැන්දාටත්...

පොත් ලියන්න කියා පණිවිඩය එවූ

මගේ ආදර "සිඟිති අම්මා"

සිඟිති කුමාරි දිසානායකටත්...

මගේ තුෂාරිකා පන්ති භාර ගුරුතුමියටත්...

සිංහල අකුරු ලස්සනට ලියවූ සේපාලිකා ගුරුතුමියටත්...

මේ පොත ලස්සනට පරිගණකයෙන් සකසා දුන්

මගේ ආදර "යාළු නැන්දි"

චතුරිකා සන්ධ්‍යාටත්...

හැමදාමත් මට ආදරේ

අත්තම්මලා - සීයලාට, මම්මලා - ලොකු

අප්පච්චිලාට, අයියලා - අක්කිලාටත්

පුංචි මගේ ස්තූතිය....!




# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමයා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නඟා, එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර, මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කර ගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදී කතෘ කරුණා අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස, අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන "හෙරණගත්කරණී" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නොඅනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.




“පින්කි” ලස්සන පුංචි අයිස් පලමක්. එයා අම්මයි තාත්තයි එක්ක ෆ්‍රිජ් එකක සීතලම කොටසේ ජීවත් වුණා.

දවසක් ෆ්‍රිජ් එකේ දොර ඇරලා

තිබුණු වෙලාවක කාටවත් නොකියා

පින්කි එළියට ආවා.



පින්කි පාර දිගේ වට පිට ලස්සන

බල බලා ඇවිදගෙන ගියා. පින්කි

ඈතටම ගියා.





මෙහෙම ටික දුරක් යනකොට රස්නෙ
වැඩි නිසා පින්කි දියවෙන්න පටන්
ගත්තා. පින්කි හොඳටම බය වුණා.
මේ බව දැක්ක ඉර මාමත් හොඳටම
කලබල වුණා.

පින්කිට අනතුරක් වේවි කියලා බයවුණ ඉර

මාමා, වළාකුළු මාමටයි, සීත සුළං

නැන්දටයි තව හිම නැන්දටයි එන්න කියලා

කෑ ගැහුවා.

ඒ අයත් ඉක්මනට එතැනට ආවා.





ඉර මාමා වළාකුළු මාමට කිව්වා

එයාව වහගන්න කියලා. නැන්දලාට

කිව්වා සීත සුළඟින් සහ හිම වලින්

පරිසරය සීතල කරන්න කියලා.

ඒ අයත් ඉර මාමා කිව්ව විදියටම

කළා. පරිසරය සීතල වෙලා හිමෙන්

වැසුණා.




පින්කි දියවෙන එක නතර වුණා.
අම්මයි තාත්තයි පින්කි හොයාගෙන
ඇවිත් තිබුණා. වැඩිහිටි හැමෝම
පුංචි පින්කිට අවවාද කලා, අම්මලා
තාත්තලාට නොකියා කොහේවත්
යන්න එපා කියලා.



පුංචි පින්කි ඒ අවවාදය පිළිගත්තා.

ඉතිං පින්කි හරිම සතුටින් නැවතත්

අම්මයි තාත්තයි ළඟට ගියා.



**පුංචි අපිත් හැමදාම වැඩිහිටියන්ට**

**පේන දුරින් ඉමු.**




**නිමි.**

# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත්, අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත්, සාහිත්‍යය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීමට සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව, 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක වූ පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වනවිට ලේඛක අංකූර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමකි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සදහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආශ්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම, සමාජය තුළ විවිධ ගැටලු, ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර, ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගළපමින්, දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමඟ එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසග, සාහිත්‍යය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්.